VIDU53 - [illegible] - 4

# විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණය


## නන්දදාස කෝදාගොඩ

අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වෛද්‍යපීඨය, කොළඹ මණ්ඩපය.


ඕනෑම සමාජයක විද්‍යාත්මක කරුණු පිළිබඳව ඇතැමෙක් වඩා වැඩි දැනුමක් ඇති අය වෙති. තවත් සමහරු සෙසු අයට වඩා නිපුණත්වයෙන් යුතුවන අතර, තවත් සමහරුන්ට වඩාත් හොඳ විද්‍යාත්මක ආකල්ප ඇත. ඔවුන්ගේ දැනුම හා නිපුණත්වයන් සහ ඔවුන්ගේ වඩා හොඳ ආකල්පයන් එතරම් භාග්‍ය සම්පන්න නොවූ විහීන සහෝදර ජනතාවට ලබාදීම එබඳු භාග්‍ය සම්පන්න පුද්ගලයන් සතු කාර්යයකි. සංනිවේදනයෙහි සාරය මෙයාකාරයෙන් තොරතුරු, නිපුණතාවයන් හා ආකල්පයන් එක් ජන කොට්ඨාශයකින් තවෙකකට සම්ප්‍රේෂණය කිරීමෙන් සමන්විත වේ.

කෙනෙකු මෙම ආකූල වූ සංනිවේදන කාර්යාවලියෙහි නියැලිය යුත්තේ ඇයි? නොඑසේ නම් සංනිවේදනයෙහි පෘථුල අරමුණ කුමක්ද? සංනිවේදනය හුදු ශාස්ත්‍රීය ව්‍යායාමයක් පමණක් නම් එය පුද්ගල විනෝදාංශයක් වනු මිස ජාතික වගකීමක් නොවනු ඇත. විද්‍යාත්මක චින්තන හා විද්‍යාව ව්‍යවහාරය හේතුකොටගෙන සමස්ත ජීවන තත්ත්වය නංවාලීමට උපකාරිවන බව ප්‍රකට සවසිද්ධියකි. ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සෑම කෙනෙකුගේම වගකීම වන අතර, විද්‍යාව සංනිවේදනය කිරීමෙන් ඊට උපකාරක විය හැකි නම්, එම කාර්යය සෑම දැන උගත් පුද්ගලයකු සතු වගකීමක් බවට පත්වේ.

සංනිවේදනය විද්‍යාවෙහි මෙන්ම අනිකුත් ක්ෂේත්‍රයන්හිදීද අවිද්‍යාමාන ආකාරයකින් වුව සෑම මොහොතකදීම ක්‍රියාත්මක වන්නාවූද, බොහෝවිට අනභිප්‍රේතවූද කාර්යාවලියකි. මෙය පුද්ගලයන් අතර මෙන්ම සමාජයේ විවිධ ස්තර අතරද සිදුවන්නකි. ඇත්ත වශයෙන්ම, සමාජ ජීවිතය අන්තයක් නැති සංනිවේදන ජාලයකි. වේගවත්ව, ස්ථිරව හා ප්‍රත්‍යක්ෂ ලෙස සංවර්ධනයට උපකාරක වීමට නම්, දරනු ලබන පරිශ්‍රමයන් ක්‍රමානුකූල, විධිමත් හා විෂය මූලික ඒවා විය යුතුවන බැවින් දිවි පැවැත්මේ කොටසක් වූ මානුෂික අන්‍යොන්‍යකාරක ඒ සඳහා ප්‍රමාණවත් නොවේ. සංනිවේදනය කළ යුතු දෑ ඉතා ශීඝ්‍රයෙන් වැඩිවෙන බැවින් ඒවා බෙදගැනීම සඳහා ඇති අවශ්‍යතාවය අතිශයින් වැදගත් බවට පත්ව ඇත. මෙය වූ කලී සංනිවේදන කාර්යය අභිප්‍රේත සහ සැලසුම් කළ යුත්තක්ද වීමට මුල් වූ අමතර හේතුවකි.

සැළසුම්කළ සංනිවේදන සැලැස්මක මූලාරම්භයේදීම සැලකිල්ලට භාජනය කළ යුතු මූලික සාධක කිහිපයක් ඇත.

තොරතුරු ලබාදිය යුත්තේ කා හටද? නැතහොත් ඉලක්ක ජනතාව කවුරුන්ද? අභාග්‍යයකට මෙන් මෙය බොහෝ සංනිවේදන කර්තව්‍යයන්හිදී පිළිතුරු නොසැපයූ පැණය වන අතර, ඒවා බොහොමයක් අසාර්ථක වීමට තුඩුදුන් හේතුවද මෙයයි. පණිවුඩය සම්ප්‍රේෂණය කළ යුතු ජන කොට්ඨාශය කෙරෙහි අවධානය යොමුකළ පසු සැලසුම්ගත සංනිවේදන කර්තව්‍ය අනුව එකී ජන කොට්ඨාශයේ ප්‍රධාන අංග ලක්ෂණ හඳුනාගෙන තක්සේරු කළ යුතුය. ඔවුන්ගේ ගණන, වයස හා ගැහැණු හා පිරිමි බෙදී ඇති අයුරු, සංප්‍රාප්තවීමට ඇති හැකියාව, අධ්‍යාපන මට්ටම, ප්‍රධාන වෘත්තීය, අවශ්‍යතා, විකලතා, අදල සංස්කෘතික ලක්ෂණ, පන්න හා චාරිත්‍ර ආදී සියල්ලම වැදගත් කරුණු වේ. මේවා විචාරණය කිරීමෙන් උපාය ක්‍රමයක් සම්පාදනය කරගැනීමෙහිලා උපකාරී වනු ඇත. මෙම කාර්ය පරිපාටිය, ඉලක්ක ජනතාව විනිශ්චය කිරීම යනුවෙන් හැඳින්විය හැකිය.

ඉලක්ක ජනතාව විනිශ්චය කිරීම ප්‍රයෝජනවත්වන අවස්ථා සම්බන්ධයෙන් දැක්විය හැකි උදාහරණ අසීමිතය. සම්ප්‍රාප්ත විය යුතු ජන සංඛ්‍යාව අල්ප නම් ජන මාධ්‍යය නාස්තිකාරී වනු ඇත. එබඳු අවස්ථාවකදී අන්තර් පුද්ගල සංනිවේදනය වියදම් අඩුම මාර්ගය වනු පමණක් නොව වඩාත් ඵලදායී ක්‍රමයද වේ. ගැමි ලියන්ට පණිවුඩය ලබාදීම අවශ්‍යතාවය වේ නම්, ගමේ පොදු ළිඳ අසල පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම වඩාත් උචිත වනු ඇත. පණිවුඩය අදහස් කරනු ලබන්නේ දුප්පත්, නූගත්, දුර පෙදෙස්වල වෙසෙන ගැමි ජනයාට නම් ජන මාධ්‍ය උපයෝගී කරගැනීම නිෂ්ඵල වනු ඇත. ධීවර වාඩියක මිනිසුන් වෙනුවෙන් අදහස් කළ පණිවුඩයක් රාත්‍රී කාලයේදී ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කළහොත් ඉන් ප්‍රතික්‍රියාවක් ඇතිවිය නොහැ. වී වලට යොදන පොහොර පිළිබඳ තොරතුරු තේ වගාවේ නියුතු අයට නිෂ්ඵල වනු ඇත. සංස්කෘතික වශයෙන් හරක් මස් කෑමට විරුද්ධ ජන කොට්ඨාශයකට මස්වල ප්‍රෝටීන් අගය වර්ණනා කිරීම නිෂ්ඵල ව්‍යායාමයක් වනු ඇත.

අපේක්ෂිත සංනිවේදන කර්තව්‍යයේ අරමුණු කවරේද? නැතහොත් සංනිවේදන ව්‍යායාමය සඵලවූවාට පසුව ඉලක්ක ජනතාව දත යුතු හා ඔවුන්ට කළහැකි වියයුතු දෑ මොනවාද? නිරාවරණයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ආකල්ප කෙබඳු ආකාරයකින් වෙනස්ව තිබිය යුතුද? සංනිවේදන උපක්‍රම නිර්මාපකයන් වෙනත් පියවර සැලසුම් කිරීමට මත්තෙන්, මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගැනීම අතිශයින්ම වැදගත් වේ. මෙයාකාරයෙන් නිරුක්ති වූ අරමුණු ප්‍රමාණවත් නියමයන් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය.

දැඩි ප්‍රායෝගික පක්ෂපාතීත්වයක් සහිත වූ උදාහරණයක් විමසා බලමු. එක් ගමක කෘෂිකාර්මික නිපැයුම පහත වැටීමට හේතුව අසූචිවලින් පස් අපවිත්‍රවීම නිසා පැතිරෙන කොකුපණු රෝගය වැළඳීමෙන් හටගත් රක්තහීනතාවය (ඇනීමියා) බවට ක්‍රම සම්පාදකයකු පිළිගෙන ඇතැයි සිතමු. මෙම අවස්ථාවේදී යොදගන්නා සංනිවේදන කාර්ය පරිපාටියෙහි පෘථුල අරමුණ විය යුත්තේ එම ප්‍රජාව අතර කොකුපණු රෝගය පැතිරයාම වැළැක්වීමය. මෙම මූලික අරමුණ ඉෂ්ට කරගැනීමට නම් සංනිවේදන කාර්යාවලිය නිෂ්ඨාවට පත්වූවාට පසුව, මිනිසුන්ට කොකුපණු රෝගය පැතිරෙන අයුරු හා එය වැළැක්විය හැකි අන්දමද මතකින් කිව හැකිවන අන්දමට එම කාර්යාවලිය සකස්කර තිබිය යුතුය. මෙහිදී ඉගැන්විය යුතු විශේෂ කුසලතාවයන් නොමැත. ඉලක්ක ජනතාව උචිත ආකල්පයක් ආරෝපණය කරගත යුතුය. එනම්:— කොකුපණු රෝගය නිසා නිෂ්පාදනය පහත වැටෙන බවත් එය වළක්වා ගැනීම අවශ්‍යයෙන්ම ඔවුන් සතු කාර්යයක් වන බවත් ඔවුන්ටම වැටහී තිබිය යුතුය. එපමණක්ද නොවේ. වැසිකිළි සාද ගැනීමට හා ඒවා පාවිච්චි කිරීමට ද ඔවුන් පෙළඹවීම මෙම ව්‍යායාමයේ ඉතා වැදගත් මුහුණුවරක් වනු ඇත.

මීළඟට මතුවන ප්‍රශ්නය නම් පණිවුඩයේ අන්තර්ගත වියයුතු නිගමනය කරගත් විශේෂ අරමුණු ඉෂ්ටකර ගැනීම උදෙසා

ඉලක්ක ජනතාවට ඉදිරිපත් කළ යුතු කරුණු මොනවාද? අදාල සියළු තොරතුරු ලබාදීම වැදගත්ය. මීටත් වඩා වැදගත්වනුයේ අනවශ්‍ය හා පමණට වඩා වැඩි විස්තර ලබා නොදීමය. කලින් සඳහන් කළ තත්ත්වය සම්බන්ධයෙන්, ආසාදිත අසූචි මගින් කොකුපණු බීජ බැහැර කෙරෙන බව හා පසෙහිදී ඒවා පිළවුන් ලෙස වැඩී නිරෝගී මිනිසුන්ගේ යටි පතුල් පසාකරගෙන ශරීරය තුළට පිවිස වැඩී බඩවැල තුළ වෙසෙමින් දුර්වලභාවය, අලස බව ආදියට හේතුවන රක්තහීනතාවය ඇති කරමින් ඔවුන්ගේ ලේ උරා බොන බවද ඔවුන්ට කියාදීම අවශ්‍ය වනු ඇත. වැසිකිළි තුළ මළපහ කිරීමෙන් මෙම හානිකර පිළිවෙල සිදුවිය නොහැකිබව අවධාරණයෙන් ප්‍රකාශ කළ යුතුය. වැසිකිළි ඉදිකිරීම සඳහා රජයෙන් ආධාර ලබාගත හැකිබව හා එබඳු ආධාර ලබාගත හැකි ආකාරයද සඳහන් කිරීම වැදගත් වේ.

ලබාදිය යුතු පණිවුඩය හා එහි පරමාර්ථය දැන් පැහැදිලිය. මෙම උපදෙස් පිළිපැදීමට මිනිසුන් කෙසේ පොළඹවාගත යුතුද? පළමුවෙන්ම මෙය රඳාපවතිනුයේ වැඩසටහන මගින් ජනයා තුළ ජනිත කරවනු ලැබූ ආකල්පයන් මතය. කොකුපණු රෝගය ඇත්ත වශයෙන්ම ද්‍රව්‍යමය හානි සඳහා වගකිව යුතු බව ඔවුන් විශ්වාස කරයි නම් හා රෝගය පැතිරයාම වැළැක්වීම වැසිකිළි ඉදිකිරීම හා ඒවා පාවිච්චි කිරීම මත රඳා පවතින බවද ඔවුන්ට ඒත්තුගැන්වී ඇති නම්, අභිප්‍රේරණය සඳහා අත්තිවාරම දමා ඇත. ක්ෂණික පුද්ගලික ප්‍රතිලාභ වූකලී වඩාත්ම ඵලදායී අභිප්‍රේරණ බලය වේ. සංනිවේදකයාගේ විශේෂඥ තත්ත්වය හා ඔහු ගොඩනගා ඇති විශ්වාසය අභිප්‍රේරණය සඳහා හේතුකාරක වන අනිකුත් සාධක වේ. යෝජිත ක්‍රියාමාර්ගයේ සාධ්‍යතාවය (ඉලක්ක ජනතාව සම්බන්ධයෙන්) සහ සමාන කණ්ඩායම්වල හෝ සම්මානිත කණ්ඩායම්වල එබඳු ක්‍රියාමාර්ග පිළිබඳ නිදසුන්ද ප්‍රයෝජනවත් පෙළඹවීම් වනු ඇත.

සංනිවේදන කාර්යාවලියේ මීළඟ පියවර නියම වශයෙන් පණිවුඩය සම්ප්‍රේෂණය කිරීමයි. මෙය කළ හැකි හොඳම මාර්ගය කුමක්ද? යොදගත යුතු මාධ්‍යය කවරේද? ඇත්තෙන්ම මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු රඳා පවතිනුයේ ප්‍රතිග්‍රාහක ජනතාවගේ අංග ලක්ෂණ මතය. මෙම මුහුණුවර මුලදීම සාකච්ඡාවට භාජනය කර ඇත.

සංනිවේදනයෙහිදී කවර විධි ශාස්ත්‍රයක් යොදගනු ලැබුවද, කල්පනාවට ගතයුතු වැදගත් කරුණු කිහිපයක් ඇත. ඉලක්ක කණ්ඩායමේ අවබෝධක ශක්තිය පිළිබඳව, විශේෂයෙන් පාරිභාෂික බස සහ විද්‍යාත්මක හා තාර්කනික චින්තන සම්බන්ධයෙන් පමණට වඩා වැඩි විශ්වාසයක් නොතැබිය යුතුය. අතාර්කික චින්තනවල එල්බ සිටින ග්‍රාමීය ජනතාව පිළිබඳව කටයුතු කිරීම අපගේ උත්තරීතර යුතුකම වුවද, එබඳු ජන කොටයාශ සම්බන්ධයෙන් මෙය අධි-සත්‍යයකි.

සංනිවේදන ක්‍රමය, අන්තර් පුද්ගල හෝ ජන මාධ්‍ය හෝ වුවද, පෝස්ටර්, මුද්‍රිත වචන, කථාව, සංගීතය, නාට්‍යය හෝ සාම්ප්‍රදයික මාධ්‍ය හෝ වුවද, අනුගමනය කළ යුතු රීති කිහිපයක් ඇත. කෙටිම පණිවුඩය වඩාත් හොඳින් තේරුම් ගත හැකිය. වඩාත් හොඳින් ධාරණය කළ හැකිය. කෙටි වාක්‍ය හා සරල භාෂාව මගින් අවබෝධය පහසු වේ. අරුත් පහද නොදුන් පාරිභාෂික පද නිෂ්ඵල වනු ඇත. ඔවුන්ට අදාල වන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිනිසුන් වඩා කැමතිය. එක්තරා සීමාවක් දක්වා කෙරෙන පුනරුක්තියෙන් ධාරණය පහසුවනු ඇත. නිදසුන් හා උපාඛ්‍යානවලින් අවධානය හසුකරගත හැකිවාක් මෙන්ම ඒවා අතිශයින් විශ්වාසජනකය. චිත්‍ර හා සටහන් අවබෝධය ප්‍රවර්ධනය කිරීමෙන් පමණක් නොව අභිප්‍රේරණයට උපස්ථම්භක වීමෙන්ද ආශ්චර්යය සිදු කරයි. ප්‍රශ්න පිළිවිසීමෙන් ජනයා අවධානාත්මක හා සුබග්‍රාහී බවට පත් කෙරෙනු ඇත.

චිත්‍ර හා සටහන් සම්බන්ධයෙන් එක් අවවාදයක් දිය යුතුව ඇත. සංනිවේදකයාට ඉතාමත් සරලව හා පැහැදිලිව පෙනෙන දෙය, නිරීක්ෂකයාට ව්‍යාකූල වූ හා තේරුමක් නැති දෙයක් ලෙස පෙනීමට ඉඩ ඇත. උදහරණයක් වශයෙන්, සෞඛ්‍ය අධ්‍යාපන චිත්‍රපට කඩයක, මැස්සෙකුගේ සමීප සේයාවක් තිරය පුරා පැතිර දැක්විණ. ඇතැම් ප්‍රේක්ෂකයන්ගේ මතය වූයේ එබඳු මැස්සන් ඔවුන්ගේ ගම්වලට නොපැමිණෙන බවය. ගැබිණි මවක් පෙන්නුම් කරන රේඛා සටහනක් ගමක පාඨක ජනතාවගෙන් තුනෙන් දෙපංගුවකට පමණ හඳුනාගත නොහැකි වූ බව ඇදහීම පවා අපහසුය.

සංනිවේදන ක්‍රියාවලියට පසුව අවශ්‍යයෙන්ම ඉටුකළ යුතු කාර්ය දෙකක් ඇත. මින් පළමුවැන්න නම්, ලබාදුන් පණිවුඩය හා අදාල සේවා සංරචක සැපයුමය. නිදසුනක් වශයෙන්, පළාත්බද සෞඛ්‍ය අධිකාරීන්ට අදාල සේවාව සැපයිය නොහැකි නම්, ජනතාවට ප්‍රතිශක්තිකරණය හා එහි වාසි කියාදී, ප්‍රතිශක්තිකරණ කළ ළමයින් බලාගැනීමට අවශ්‍ය නිපුණතාවන්ද ඔවුන්ට ලබාදෙමින් සියලුම ළමයින් ප්‍රතිශක්තිකරණ කිරීමට ඔවුන් පෙළඹවීමෙහි අර්ථයක් නැත. ඇත්ත වශයෙන්ම එබඳු අධ්‍යාපනික වැඩ සටහන් මගින් ඉලක්ක කණ්ඩායම තුළ ඉච්ඡාභංගත්වය ඇතිකර, එමගින් වෙනත් සංනිවේදක වැඩ සටහන් කෙරෙහි ඔවුන් තුළ උදාසීනත්වයක්ද ඇති කරවයි.

අධ්‍යාපනික වැඩ සටහනකට පසුව එළඹෙන කාර්යයකි ඉලක්කය කෙරෙහි ඉන් ඇතිවූ බලපෑම අගැයුම් කිරීම. වැඩ සටහනෙන් ඇතිවූ ප්‍රතිඵල මැන ගැනීම දුෂ්කර වුවද අත්‍යාවශ්‍ය කාර්යයකි. අධ්‍යාපනික වැඩසටහනක් අවසානයේදී දෙවනුව කළ යුතු කාර්යයකි ඉලක්කය කෙරෙහි ඉන් ඇතිවූ ආභාෂය අගැයුම් කිරීම. වැඩ සටහනෙන් ඇතිවූ ප්‍රතිවිපාක මැන ගැනීම දුෂ්කර කාර්යයක් විය හැකි වුවද එය අත්‍යවශ්‍ය වූ කාර්යයක් වන අතර එය කළ හැකි මාර්ග කිහිපයක්ම ඇත.

''ආර්ථික හා සමාජීය ප්‍රගතිය බොහෝ දුරට විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු සම්ප්‍රේෂණය මත රඳා පවත්නා බවට කිසිදු සැකයක් නැත. එමනිසා එබඳු තොරතුරු මූලාශ්‍ර ලබාගැනීමට හා එයින් ප්‍රශස්ත උපයෝගිතාවයද ලබාගැනීමට අවශ්‍ය අවරව්‍යුහය ස්ථාපනය කරගැනීම සඳහා සංවර්ධනය වන්නාවූ රටවලට උදව් දිය යුතුය.''

රෙනී මාහියු

යුනෙස්කෝවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්.